00475

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජයීය විද්‍යා පීඨය

නීති අධ්‍යයනාංශය

නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2021/22

**LLU5712/LWU3315 - අන්තර්ජාතික නීතිය**

කාලය - පැය 3 යි.

---

දිනය: **2023** ජනවාරි **20** වේලාව: පෙ.ව **09.30** - ප.ව **12.30**

---

<u>ඕනෑම ප්‍රශ්න පහකට **(05)**</u> පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

**1.** අන්තර්ජාතික යුක්ති අධිකරණ ව්‍යවස්ථාවේ 38(1) වගන්තිය අන්තර්ජාතික නීති මූලාශ්‍ර සම්බන්ධයෙන් වඩාත්ම බලධාරී ප්‍රකාශය ලෙස පුළුල් වශයෙන් පිළිගනී. කෙසේ වෙතත්, එකී මූලාශ්‍ර වල ධූරාවලියට අදාළ ගැටලු විසඳීමට මෙම වගන්තිය ප්‍රමාණවත් තරම් දුරට නොවන බවක් පෙනී යයි. නිදසුනක් වශයෙන්, අන්තර්ජාතික යුක්ති පිළිබඳ අධිකරණයේ ව්‍යවස්ථාව බලාත්මක වී වසර හැත්තෑවකට වැඩි කාලයක් ගත වී ඇතත් චාරිත්‍ර හා සන්ධාන නීතිය අතර ප්‍රමුඛතාවය පිළිබඳ ගැටලුව තවදුරටත් සංකීර්ණව පවතී.

අන්තර්ජාතික නීතියේ මූලාශ්‍ර වශයෙන් චාරිත්‍ර සහ සන්ධාන නීතියේ වැදගත්කම පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය පිළිබඳව අදහස් දක්වන්න.

ඔබේ පිළිතුර අදාළ නඩු තීන්දු ඇසුරින් තහවුරු කරන්න.

(ලකුණු 20)

**2.** "මතභේදය යොමු වී ඇත්තේ දේශීය නීතිය හා සසඳන කල අන්තර්ජාතික නීතියේ නියාමයන් උල්ලංඝනය කිරීමේදී ඒ සඳහා දඬුවම් නොපවතින බව සහ එමෙන්ම අන්තර්ජාතික නීතිය එහි සඵලදායිත්වය සහ බලාත්මකභාවය යන ප්‍රශ්නය හමුවේ 'නීතියක්' වන්නේද යන්න පිළිබඳව නිරන්තරයෙන්ම පවතින ව්‍යාකූල තත්වයයි."

*Peter Malanczuk, Akehurst's Modern Introduction to International Law, 7 th ed, p.5.*

අන්තර්ජාතික නීතියේ තත්කාලීන අදාලත්වය කෙරෙහි අවධානය යොමු කරමින් උක්ත ප්‍රකාශයෙහි වලංගුභාවය විවේචනාත්මකව අගයන්න.

ඔබගේ පිළිතුර සඳහා හේතු දක්වන්න.

(ලකුණු 20)

3. ස්වෛරීභාවය, ස්වයං නිර්ණය සහ පිළිගැනීම රාජ්‍යත්වයේ වැදගත්ම කුළුණු වේ.

රාජ්‍යත්වය අත්කර ගැනීමේදී ඉහත ප්‍රකාශයේ සඳහන් කුළුණු තුනෙහි කාර්යභාරය සහ ඒවායෙහි වැදගත්කම අගයන්න.

ඔබගේ පිළිතුරට අදාළ නඩු තීන්දු නීතිය සහ තත්කාලීන රාජ්‍ය පරිචයන් පිළිබඳ උදාහරණද දක්වමින් ඔබගේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 20)

4. 1945 සිට, රාජ්‍යන්හි කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරන අතර අනෙකුත් අන්තර්ජාතික පාත්‍රයන්ද නැගී සිටීම ඇරඹී තිබේ. යම් ආයතනයක් අන්තර්ජාතික ප්‍රජාවේ සාමාජිකයෙකු ලෙස හඳුනාගෙන ජාත්‍යන්තර නීතියෙන් පාලනය වන්නේද යන්න තීරණය කරන මූලධර්ම සහ භාවිතයන් ද ඒ අනුව කාලයත් සමඟ සැලකිය යුතු ලෙස වෙනස්කම් වලට ලක්ව තිබේ.

ඉහත ප්‍රකාශය මගින් අන්තර්ජාතික නෛතික පුද්ගලභාවය පිළිබඳ සංකල්පයෙහි ක්‍රමික විකාශනය නිවැරදි ලෙස පිළිබිඹු කරන්නේද? සාකච්ඡා කරන්න.

අදාළ නෛතික අධිකාරීන් ඇසුරෙන් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 20)

5. "අන්තර්ජාතික වගකීම පිළිබඳ මූලධර්මය අභ්‍යන්තරික ලෙස සලකන කල දේශීය නීතිය සහ රාජ්‍යයක පරමාධිපත්‍යය අතර අංගනයක් ලෙස අර්ථකථනය කල හැකි අතර එක් අතකට අන්තර්ජාතික නීතියේ මූලධර්ම හැකිතාක් යථාර්ථවාදී ලෙස බලාත්මක කිරීමේ පරම ඉලක්කයක් අනෙක් අතට කැපී පෙනෙන පරිදි බල කිරීමක් (ධ්‍රැවලියෙහි උපරිම මට්ටම වශයෙන්) ද පවතී."

Dimitrovska, M, *The Concept of International Responsibility of State in the International Public Law System*, Journal of Liberty and International Affairs, Vol. 1, No. 2, 2015, p.2.

රාජ්‍යය වගකීම යන සංකල්පයේ වපසරිය සහ අදාලත්වය ඉහත ප්‍රකාශය ආශ්‍රයෙන් විග්‍රහ කරන්න.

(ලකුණු 20)

**ප්‍රශ්න අංක 6 සහ 7 පහත සිද්ධිය මත පදනම් වේ.**

අමර සහ සමර රාජ්‍යය, දකුණු කහ මුහුදේ රාම සමුද්‍ර සන්ධියෙන් වෙන් වී ඇති අසල්වැසි රාජ්‍යයන් දෙකකි. මෙම සමුද්‍ර සන්ධිය මධ්‍යයයේ විදූර නම් දිවයිනක් පිහිටා ඇති අතර සමුද්‍ර සන්ධිය සහ එම දිවයිනේ භූමි ප්‍රදේශය දකුණු කහ මුහුදේ ප්‍රධාන නාවික ගමනාගමන මාර්ගයට මෙන්ම පොහොසත් මත්ස්‍යය බිම් ගණනාවකටද සමීපව පිහිටා ඇත. සමර රාජ්‍යය තර්ක කරන්නේ එම දිවයින සියවස් ගණනාවකට පෙර මිනුම් කොට "***terra nullius***" (කිසිවෙකුටත් අයත් නැති භූමියක්) වන බව සොයා ගත් බවයි. මෙම කලාපයේ ඇති වූ සිවිල් යුද්ධයෙන් අනතුරුව, සමර රාජ්‍යය විසින් විදූර දිවයින තමන්ට අයත් බව ප්‍රකාශ කළේය. මේ අතර අමර රාජ්‍යය තර්ක කරන්නේ විදූර දිවයින ඔවුන්ට අයත් බවට පෙන්වීමට තමන් සතුව ලේඛනගත සාක්ෂි පවතින බවයි. විශේෂයෙන්ම, මෙම දිවයින අමර රාජ්‍යය සහ මධුර රාජ්‍යය අතර ඇති "අන්‍යෝන්‍ය සහයෝගීතා සහ ආරක්ෂාව පිළිබඳ ගිවිසුමට" ඇතුළත් වේ. එකී ගිවිසුමට අනුව, අමර රාජ්‍යයට විදූර දිවයිනේ ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහා අවශ්‍යය නම් මධුර රාජ්‍යයේ සහාය ලබා ගත හැකි වෙයි.

තවමත් නොවිසඳුණු මෙම අර්බුදය දැනට වසර **40** කට වැඩි කාලයක් තිස්සේ පවතින අතර ඓතිහාසික කරුණු මත පදනම්ව රාජ්‍යයන් දෙකම මෙම දිවයිනේ අයිතියට හිමිකම් ඉල්ලා සිටී. කෙසේ වෙතත්, විදූර දිවයිනේ අයිතිය දැනට අමර රාජ්‍යයේ පාලනය යටතේ පවතී. 2021 නොවැම්බර් 23 වන දින, අමර රාජ්‍යය විදූර දිවයින ඇතුළත් "දකුණු කහ මුහුදේ ගුවන් ආරක්ෂක හඳුනාගැනීමේ කලාපය" පිහිටුවන ලද අතර, කලාපයට ඇතුළු වන සියලුම ගුවන් යානා පියාසැරි සැලැස්මක් ගොනු කර රේඩියෝ සංඛ්‍යාත හෝ "ට්‍රාන්ස්පොන්ඩර්" **(transponder)** විස්තර ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන බවද නිවේදනය කළේය. අලුතින් පනවන ලද මෙම රෙගුලාසි **සමගින්** අමර රාජ්‍යය සහ සමර රාජ්‍යය අතර විදූර දිවයින සම්බන්ධයෙන් ඇතිව තිබූ ආරවුල යළි ඉස්මතු විය. 2021 දෙසැම්බර් මාසයේදී සමර රාජ්‍යය නිල ප්‍රකාශයක් නිකුත් කරමින් කියා සිටියේ විදූර දිවයිනේ අයිතිය ඔවුන්ට ලබා නොදුනහොත් ඔවුන් දිවයිනට පහර දීමට අදහස් කරන බවයි. මේ අතර අදාළ නිල නිවේදනය නිකුත් වීමත් සමඟ අමර

රාජ්‍යයේ විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් මෙම ආරවුල විසඳා ගැනීම සඳහා සමර රාජ්‍යය සමග සාමකාමී සාකච්ඡා ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බව දන්වා සිටියේය. කෙසේ වෙතත්, මෙම නිල නිවේදනයට කිසිඳු පිළිතුරක් නොලැබුණු අතර සමර රාජ්‍යයෙන් ඒ පිළිබඳව කිසිදු පියවරක්ද ගෙන නොමැත. ඊළඟ පියවර ලෙස, සමර රාජ්‍යය දේශ සීමා ඔස්සේ සිය සන්නද්ධ හමුදාවන් එක්රැස් කර, තම යුධ ටැංකි අමර රාජ්‍යය දෙසට ඉලක්ක කරන ලදී.

සාකච්ඡා කිරීම් සඳහා අමර රාජ්‍යයේ ආණ්ඩුව කළ ඉල්ලීමෙන් සති දෙකකට පසු, සමර රාජ්‍යය විසින් විදුර දිවයින ඉලක්ක කරමින් බෝම්බ ප්‍රහාරයක් එල්ල කරන ලදී. එහිදී ධීවරයින් 200 දෙනෙකුට ජීවිත අහිමි වූ අතර නුරායි වරාය නගරයට දැඩි ලෙස හානි සිදු විය. මෙම ප්‍රහාරයේදී සමර රාජ්‍යය විසින් අන්තර්ජාතික වගකීම් හා බැඳීම් දැඩි ලෙස උල්ලංඝනය කළ බවත්, ඒ අනුව ජාත්‍යන්තර ප්‍රජාව සමර රාජ්‍යයට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතු බවත් ප්‍රකාශ කරමින් අමර රාජ්‍යයේ ජනාධිපතිවරයා නිල නිවේදනයක් නිකුත් කළේය. තවද, සමර රාජ්‍යයෙන් තවත් ප්‍රහාරයක් තමන් අපේක්ෂා කරන බවත්, එවැනි තවත් ප්‍රහාරයක් එල්ල වීමේ අවදානමක් තමන් වෙත ඇති බව පෙනී යන්නේ නම්, ප්‍රහාරයක් දියත් කිරීමට තම රාජ්‍යය කිසි විටකත් පසුබට නොවන බවත්, අමර රාජ්‍යයේ ජනාධිපතිවරයා වැඩි දුරටත් පෙන්වා දුන්නේය.

6. බලය භාවිතා කිරීම සම්බන්ධ අන්තර්ජාතික නෛතික මූලධර්ම, දෙන ලද සිද්ධියට ඔබ අදාළ කරන්නේ කෙසේද?

   ජාත්‍යන්තර නීති ප්‍රමිතීන්, නඩු තීන්දු නීතිය සහ තත්කාලීන උදාහරණ ගෙනහැර දක්වමින් අමර, සමර සහ මධුර යන රාජ්‍යන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් ඔබේ පිළිතුර ගොඩ නගන්න.

(ලකුණු 20)

7. ඔබ අමර රාජ්‍යයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ සේවය කරන නීති පර්යේෂකයෙක් යැයි සිතන්න. සමර රාජ්‍යය සමඟ ඇති ආරවුල විසඳීම සඳහා අන්තර්ජාතික නීතිය යටතේ පවතින සාමකාමී ආරවුල් විසඳීමේ ක්‍රම පිළිබඳව අමර රාජ්‍යයේ ජනාධිපතිවරයා වෙත උපදෙස් පත්‍රිකාවක් සකස් කරන්න.

අදාළ නෛතික අධිකාරීන් උපුටා දක්වන්න.

(ලකුණු 20)

**8.** තානාපති විනිර්මුක්තිය සම්බන්ධ නීතිය රැඩිකල් ලෙස ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාව සාක්ෂාත් කරගැනීම, 1961 තානාපති විනිර්මුක්තිය පිළිබඳ වියානා සම්මුතිය ඇති කර ගැනීමට මූලිකව ම හේතු විය. කෙසේ වෙතත්, තානාපති විනිර්මුක්තිය එහි මුල් අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කරන්නේ ද යන්න විවාදාත්මකය.

තානාපති විනිර්මුක්තිය පිළිබඳ ජාත්‍යන්තර නීතියේ ඓතිහාසික වර්ධනය සහ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලවල ඵලදායී ක්‍රියාකාරිත්වය සහතික කිරීමේ වර්තමාන අවශ්‍යතාව අනුව ඉහත ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

--- හිමිකම් ඇවිරිණි --